# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## අපරාධ නඩු විධාන සංග්‍රහය
## (විශේෂ විධිවිධාන)

**විමර්ශන පැවැත්වීම පහසු කිරීම සඳහා වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගනු ලැබූ තැනැත්තන් රඳවා තබා ගැනීමේ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; ඇතැම් නඩුවල දී ලඝු නොවන පරීක්ෂණ පැවැත්වීම බැහැර කිරීම සඳහා ද; පැමිණිල්ලේ සාක්ෂිකරුවන්ගේ දිවුරුම් සාක්ෂි ලබාගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනත් කෙටුම්පතකි**

---

අධිකරණ අමාත්‍යතුමා විසින් 2012 ඔක්තෝබර් මස 11 වන දින
ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2012 සැප්තැම්බර් මස 24 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[186 වන පනත් කෙටුම්පත]**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිළ : රු. 11.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 5.00 යි.**

## අපරාධ නඩු විධාන සංග්‍රහය
## (විශේෂ විධිවිධාන)

එල්. ඩී.—ඕ. 51/2011.

**විමර්ශන පැවැත්වීම පහසු කිරීම සඳහා වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගනු ලැබූ තැනැත්තන් රඳවා තබා ගැනීමේ කාලසීමාව දීර්ඝ කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; ඇතැම් නඩුවල දී ලඝු නොවන පරීක්ෂණ පැවැත්වීම බැහැර කිරීම සඳහා ද; පැමිණිලිලේ සාක්ෂිකරුවන්ගේ දිවුරුම් සාක්ෂි ලබා ගැනීම සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද; ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

**1.** මේ පනත 2012 අංක දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ඇතැම් නඩුවල දී සිරභාරයට ගත් තැනැත්තකු රඳවා තබා ගැනීමේ කාලසීමාව පැය විසිහතරක් හෝ පැය හතළිස් අට නොඉක්මවීම.

**2.** 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 43(අ) වගන්තියේ විධිවිධානවල හැර, එම පනතේ වෙනත් විධිවිධානවල කුමක් සඳහන් වුව ද, යම් සාම නිලධරයකු විසින්, වරෙන්තුවක් නොමැතිව සිරභාරයට ගනු ලැබූ තැනැත්තකු, නඩුවක අවස්ථානුගත සියලු කරුණු යටතේ යුක්ති සහගත වන කාලසීමාවකට වඩා දීර්ඝ කාලසීමාවක් සඳහා අත්අඩංගුවේ රඳවා තබා ගැනීම හෝ අන්‍යාකාරයකින් සිරකර තැබීම නොකළ යුතු අතර, එම කාලසීමාව සිරභාරයට ගනු ලැබූ ස්ථානයේ සිට මහෙස්ත්‍රාත්වරයා ඉදිරියට යාමට අවශ්‍ය කාලය අතහැර, පැය විසිහතරක් නොඉක්මවිය යුතු ය:

එසේ වුව ද, සිරභාරයට ගැනීම මේ පනතේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වරදකට අදාළව සිදු කරනු ලැබ ඇති අවස්ථාවක, සිරභාරයට ගනු ලැබූ තැනැත්තා මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීමේ දී සහ වැඩිදුර විමර්ශන සඳහා එම තැනැත්තා රඳවා තබා ගැනීම අවශ්‍ය බවට, සහකාර පොලිස් අධිකාරීවරයකුගේ නිලයට වඩා අඩු නොවන නිලයක පොලිස් නිලධරයකු විසින් ගොනු කරනු ලබන සහතිකයක් මත, මහෙස්ත්‍රාත්වරයා විසින්

2—PL 005976—1000 (2012/09)

තත්කාර්ය සඳහා කරනු ලබන ආඥාවක් මත, පොලිස් අත්අඩංගුවේ රඳවා තබා ගැනීමේ කාලසීමාව පැය විසිහතරක් නොඉක්මවන තවදුරටත් වූ කාලසීමාවක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය: එසේ වුව ද, රඳවා තබා ගැනීමේ මුළු කාලසීමාව පැය හතළිස් අටක් නොඉක්මවිය යුතු ය:

එසේම තවදුරටත්, සිරභාරයට ගෙන වැඩිදුර කාලයක් රඳවා තබා ගනු ලැබූ තැනැත්තාට, එසේ රඳවා තබාගනු ලබන කාලසීමාව තුළ දී, තමන් විසින් තෝරා ගනු ලබන නීතිඥයකුගේ උපදෙස් ලබා ගැනීමට සහ යම් ඥාතියකු හෝ මිත්‍රයකු සමග සංදේශනය කිරීමට අවස්ථාව ලබා දිය යුතු ය.

බරපතල අවස්ථානුගත කරුණුවල දී සිදු කරනු ලබන වැරදි සම්බන්ධයෙන් කෙලින් ම අධිචෝදනා කිරීම.

3. (1) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ කුමක් සඳහන් වුව ද, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වරදක් සිදු කිරීමට අදාළව, බරපතල අවස්ථානුගත කරුණු හෝ මහජන නොසන්සුන්තාවක් පැනනගින අවස්ථානුගත කරුණු ඇති අවස්ථාවක, නීතිපතිවරයා විසින් කෙලින් ම අධිචෝදනා පත්‍ර මහාධිකරණය වෙත ඉදිරිපත් කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව නීතිපතිවරයා විසින් අධිචෝදනා කෙලින් ම භාර දීමේ දී තමා විසින් සිය මෙහෙයවීමෙන් ම හෝ මහෙස්ත්‍රාත්වරයාගෙන් අදාළ වාර්තාව ලැබීමෙන් පසු එසේ කළ හැකි ය.

මහෙස්ත්‍රාත්වරයා විසින් වාර්තාව නීතිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු බව.

4. (1) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ කුමක් සඳහන් වුව ද, 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ දෙවන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති වරදක් සිදු කිරීමට අදාළව බරපතල අවස්ථානුගත කරුණු හෝ මහජන නොසන්සුන්තාවක් ඇති කරවන අවස්ථානුගත කරුණු හෝ ඇති අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XV වන පරිච්ඡේදය ප්‍රකාරව මූලික පරීක්ෂණයක් නොපැවැත්විය යුතු අතර, නඩු වාර්තාව වහාම නීතිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. ඉන් පසුව, මහෙස්ත්‍රාත්වරයා නීතිපතිවරයාගේ උපදෙස් පිළිපැදිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ප්‍රකාරව මහෙස්ත්‍රාත්වරයාගෙන් නඩු වාර්තාව ලැබීමේ දී නීතිපතිවරයා විසින්—

(අ) ඉහත කී වරද සිදු කිරීම සම්බන්ධයෙන් බරපතල අවස්ථානුගත කරුණු හෝ මහජන නොසන්සුන්තාවය ඇති කරවන අවස්ථානුගත කරුණු ඇති බව නීතිපතිවරයාගේ මතය වන අවස්ථාවක, ඔහු විසින් අධිචෝදනා කෙලින්ම මහාධිකරණය වෙත ඉදිරිපත් කළ යුතු ය ;

(ආ) අවස්ථානුගත කරුණු අනුව අධිචෝදනා කෙලින් ම මහාධිකරණය වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවන බව නීතිපතිවරයාගේ මතය වන අවස්ථාවක, නඩු වාර්තා තමා වෙත ලැබී දින තිහක් ඇතුළත, ඔහු විසින් එම වාර්තා මහෙස්ත්‍රාත්වරයා වෙත ආපසු යැවිය යුතු අතර, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XV පරිච්ඡේදය ප්‍රකාරව මූලික පරීක්ෂණයක් පවත්වන ලෙස මහෙස්ත්‍රාත්වරයාට විධාන කළ යුතු ය.

(3) ඉහත කී පනතේ XV පරිච්ඡේදය ප්‍රකාරව මහෙස්ත්‍රාත්වරයා විසින් මූලික පරීක්ෂණයක් පැවැත්වීමට කටයුතු කළහොත්, අධිචෝදනා කෙළින් ම මහාධිකරණය වෙත ඉදිරිපත් කිරීම සලකා බැලීමේ කාර්යය සඳහා නීතිපතිවරයා විසින් නඩු වාර්තාව කැඳවිය යුතු ය. එවැනි අවස්ථාවක මහෙස්ත්‍රාත්වරයා මූලික පරීක්ෂණ වහාම නැවැත්විය යුතු අතර, පරීක්ෂණ වාර්තා නීතිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඉන් පසු නීතිපතිවරයාගේ උපදෙස් පිළිපැදිය යුතු ය.

නඩු කටයුතු දින අනූවකින් අවසන් කළ යුතු බව.

**5.** මේ පනතේ විධිවිධාන ප්‍රකාරව වූ යම් නඩු කටයුත්තක්, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XV පරිච්ඡේදය යටතේ නඩු කටයුතු ආරම්භවීමේ දින සිට දින අනූවක් ඇතුළත අවසන් කරනු ලැබිය යුතු ය.

දිවුරුම් සාක්ෂි.

**6.** (1) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XV පරිච්ඡේදයේ කුමක් සඳහන් වුව ද, ඉහත කී පරිච්ඡේදය යටතේ පරීක්ෂණයක් පැවැත්වීමේ දී, සිද්ධිය පිළිබඳ සිද්ධිමය කරුණු සහ අවස්ථානුගත කරුණු පිළිබඳව දන්නා තැනැත්තන්ගේ ප්‍රකාශ ලබා ගැනීම සම්බන්ධයෙන් පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතු ය.

(2) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XI පරිච්ඡේදය ප්‍රකාරව පවත්වන ලද විමර්ශනය අතරතුර දී සාක්ෂිකරු විසින් කරන ලද ප්‍රකාශය, (II) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව මහෙස්ත්‍රාත්වරයා විසින් චූදිතයා ඉදිරිපිට දී සහ චූදිතයාට ඇසෙන පරිදි, චූදිතයාට එරෙහිව ඉදිරිපත් කර ඇති සෑම සාක්ෂිකරුවකුටම කියවනු ලැබිය යුතු ය; නැතහොත් කියවනු ලැබීමට කටයුතු සැලැස්විය යුතු ය. තව ද, ප්‍රකාශය, සාක්ෂිකරු විසින් පොලීසියට කර ඇති ප්‍රකාශයේ නිවැරදි වාර්තාවක් ද යන්න මහෙස්ත්‍රාත්වරයා විසින් සාක්ෂිකරුගෙන් විමසිය යුතු ය.

(3) (අ) (1) වන උපවගන්තිය යටතේ සාක්ෂිකරුගෙන් කරන ලද විමසීමට ප්‍රතිචාර වශයෙන්, එම ප්‍රකාශය, තමා විසින් පොලීසියට කරන ලද ප්‍රකාශයේ නිවැරදි වාර්තාවක් බව සාක්ෂිකරු ප්‍රකාශ කරන්නේ නම්, මහෙස්ත්‍රාත්වරයා විසින් එම කරුණු වාර්තාගත කළ යුතු ය. තමාගේ මුල් ප්‍රකාශයට යම් එකතු කිරීම් හෝ වෙනස් කිරීම් සිදු කිරීමට සාක්ෂිකරු ඉල්ලා සිටී නම් මහෙස්ත්‍රාත්වරයා ඊට අවසර දිය යුතු ය. එවැනි සෑම එකතු කිරීමක් හෝ වෙනස් කිරීමක් ම වාර්තාගත කළ යුතු ය.

(ආ) චූදිතයා විසින් හෝ ඔහුගේ උත්තරවාදියා විසින් සාක්ෂිකරුගෙන් යම් හරස් ප්‍රශ්න ඇසීමට මහෙස්ත්‍රාත්වරයා අවසර නොදිය යුතු නමුත් විමර්ශනය අතරතුර දී සාක්ෂිකරු විසින් කරන ලද ප්‍රකාශයෙන් හෝ සාක්ෂිකරුගේ මුල් ප්‍රකාශයට යම් එකතු කිරීමක් හෝ වෙනස් කිරීමක් සිදු කර ඇත්නම්, එම එකතු කිරීමෙන් හෝ වෙනස් කිරීමෙන් පැන නගින යම් කරුණක් පිළිබඳව චූදිතයාට හෝ ඔහුගේ උත්තරවාදියාට අවශ්‍ය යම් පැහැදිලි කිරීමක් මහෙස්ත්‍රාත්වරයා විසින් සාක්ෂිකරුගෙන් විමසිය යුතු අතර, එවැනි යම් කරුණක් පිළිබඳව මහෙස්ත්‍රාත්වරයාට අවශ්‍ය යම් පැහැදිලි කිරීමක් සම්බන්ධයෙන් ද මහෙස්ත්‍රාත්වරයා විසින් සාක්ෂිකරුගෙන් විමසිය හැකි ය. එසේ කරනු ලබන සෑම පැහැදිලි කිරීමක් ම වාර්තාගත කළ යුතු ය:

එසේ වුව ද, සාක්ෂිකරුවකු විසින් පොලීසියට කරන ලද ප්‍රකාශයක අන්තර්ගත කරුණුවල ස්වභාවය සැලකිල්ලට ගෙන, චූදිතයා හෝ ඔහුගේ උත්තරවාදියා විසින් හරස් ප්‍රශ්න ඇසීම සඳහා පැමිණිලි පක්ෂය විසින් සාක්ෂිකරු ඉදිරිපත් කළ හැකි ය.

(4) ඉන් පසුව විමර්ශනය අතරතුර දී සාක්ෂිකරු විසින් කරන ලද ප්‍රකාශයේ නිරවද්‍යතාවය ස්ථිර කරමින් සාක්ෂිකරු විසින් අධිකරණයට කර ඇති ප්‍රකාශය ද, (2) වන උපවගන්තිය යටතේ සාක්ෂිකරු විසින් යම් පැහැදිලි කිරීමක් සිදු කර ඇත්නම් එම පැහැදිලි කිරීම ද, (3) වන උපවගන්තිය යටතේ සාක්ෂිකරු විසින් යම් එකතු කිරීමක් හෝ වෙනස් කිරීමක් සිදු කර ඇත්නම් එම එකතු කිරීම් හෝ වෙනස් කිරීම් ද, මහෙස්ත්‍රාත්වරයා විසින් සාක්ෂිකරුට කියවනු ලැබිය යුතු ය; නැතහොත් කියවීමට සලස්වනු ලැබිය යුතු ය. තව ද වාර්තාගත කරන ලද කරුණුවල සත්‍යතාවය පිළිබඳව දිවුරුම් දෙන ලෙස හෝ ප්‍රතිඥා දෙන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් සාක්ෂිකරුට නියම කරනු ලැබිය යුතු ය.

(5) (අ) අනෙක් අතට, ප්‍රකාශය සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක්, තමා විසින් පොලීසියට කරන ලද ප්‍රකාශයේ නිවැරදි වාර්තාවක් නොවන බව, (1) වන උපවගන්තිය යටතේ සාක්ෂිකරුගෙන් කරන ලද විමසීමට ප්‍රතිචාර වශයෙන් සාක්ෂිකරු ප්‍රකාශ කරන්නේ නම්, වරදට අදාළ අවස්ථාගත කරුණු පිළිබඳ විස්තරයක් ඉදිරිපත් කිරීමට හෝ සාක්ෂිකරු විසින් සිදු කිරීමට කැමති ආකාරයට ඔහුගේ මුල් ප්‍රකාශයට අවස්ථාවෝචිත පරිදි එකතු කිරීම් හෝ වෙනස් කිරීම් සිදු කිරීමට මහෙස්ත්‍රාත්වරයා විසින් සාක්ෂිකරුට අවසර දිය යුතු ය.

(ආ) චූදිතයා විසින් හෝ ඔහුගේ උත්තරවාදියා විසින් සාක්ෂිකරුගෙන් හරස් ප්‍රශ්න ඇසීමට මහෙස්ත්‍රාත්වරයා විසින් අවසර නොදිය යුතු නමුත් සාක්ෂිකරු විසින් ඉදිරිපත් කරන ලද විස්තරයෙන් හෝ සිදු කරන ලද එකතු කිරීම් හෝ වෙනස් කිරීම් වලින් පැන නගින යම් කරුණක් පිළිබඳව චූදිතයාට හෝ ඔහුගේ උත්තරවාදියාට අවශ්‍ය යම් පැහැදිලි කිරීමක් මහෙස්ත්‍රාත්වරයා විසින් සාක්ෂිකරුගෙන් විමසිය යුතු ය; නැතහොත් එවැනි යම් කරුණක් පිළිබඳ මහෙස්ත්‍රාත්වරයාට අවශ්‍ය වන යම් පැහැදිලි කිරීමක් පිළිබඳව මහෙස්ත්‍රාත්වරයා ම සාක්ෂිකරුගෙන් විමසිය හැකි ය:

එසේ වුව ද, සාක්ෂිකරුවකු විසින් පොලීසියට කරන ලද ප්‍රකාශයේ අන්තර්ගත කරුණුවල ස්වභාවය සැලකිල්ලට ගෙන, චූදිතයා හෝ ඔහුගේ උත්තරවාදියා විසින් හරස් ප්‍රශ්න ඇසීම සඳහා පැමිණිලි පක්ෂය විසින් සාක්ෂිකරු ඉදිරිපත් කළ හැකි ය.

(ඇ) ඉදිරිපත් කරන ලද විස්තරය හෝ (අ) ඡේදය යටතේ සාක්ෂිකරු විසින් කරන ලද එකතු කිරීම් හෝ වෙනස් කිරීම් සහ (ආ) ඡේදය යටතේ සාක්ෂිකරු විසින් කරන ලද පැහැදිලි කිරීම් මහෙස්ත්‍රාත්වරයා විසින් වාර්තාගත කළ යුතු අතර, සාක්ෂිකරුට එම කරුණු කියවනු ලැබිය යුතු ය; නැතහොත් කියවීමට සලස්වනු ලැබිය යුතු ය. තව ද එසේ වාර්තා ගත කරන ලද කරුණුවල සත්‍යතාවය පිළිබඳව දිවුරුම් දෙන ලෙස හෝ ප්‍රතිඥා දෙන ලෙස මහෙස්ත්‍රාත්වරයා සාක්ෂිකරුට නියම කරනු ලැබිය යුතු ය.

(6) චූදිතයාට එරෙහිව සාක්ෂිකරුවකු ඉදිරිපත් කිරීමට පෙර, විමර්ශනය අතරතුර දී සාක්ෂිකරු විසින් පොලීසියට කරන ලද ප්‍රකාශය විවෘත අධිකරණයේ කියවා බැලීමට මහෙස්ත්‍රාත්වරයා විසින් චූදිතයාට හෝ ඔහුගේ උත්තරවාදියාට අවසර දිය යුතු ය.

(7) විමර්ශනය අතරතුර දී සාක්ෂිකරු විසින් පොලිසියට කරන ලද ප්‍රකාශයේ සහතික පිටපතක් මහෙස්ත්‍රාත්වරයා විසින් අත්සන් කර සාක්ෂිකරුට ද ඊට අත්සන් තැබීමට සලස්වා එය නඩු වාර්තාවට ගොනු කිරීමට සලස්වනු ලැබිය යුතු ය. එසේ ගොනු කරනු ලබන පිටපත සියලු කාර්යය සඳහා පරීක්ෂණ වාර්තාවේ කොටසක් විය යුතු ය.

(8) මහෙස්ත්‍රාත්වරයා විසින් විශේෂඥ සාක්ෂිකරුවකු හෝ පොලිස් නිලධරයකු නොකැඳවිය යුතු නමුත්, අවස්ථාවෝචිත පරිදි, එම විශේෂඥ සාක්ෂිකරුගේ වාර්තාව හෝ එම පොලිස් නිලධරයාගේ දිවුරුම් ප්‍රකාශය ඉදිරිපත් කොට නඩු වාර්තාවට ගොනු කිරීමට මහෙස්ත්‍රාත්වරයා කටයුතු සැලැස්විය යුතු ය:

එසේ වුව ද, මහෙස්ත්‍රාත්වරයා විසින්, වාර්තාගත කළ යුතු හේතු අනුව සහ විශේෂඥ සාක්ෂිකරුවකු සම්බන්ධයෙන් වන විට නීතිපතිවරයාගේ පූර්ව අවසරය ඇතිව, සාක්ෂි දීම සඳහා අධිකරණයට පැමිණෙන ලෙස විශේෂඥ සාක්ෂිකරුවකු හෝ පොලිස් නිලධරයකු අධිකරණයට කැඳවනු ලැබිය හැකි ය.

(9) (8) වන උපවගන්තිය යටතේ තමා වෙත නිකුත් කරන ලද සිතාසි අනුව යම් විශේෂඥ සාක්ෂිකරුවකු හෝ පොලිස් නිලධරයකු අධිකරණයේ පෙනී සිටින අවස්ථාවක, චූදිතයා විසින් හෝ ඔහුගේ

උත්තරවාදියා විසින් එම විශේෂඥ සාක්ෂිකරුගෙන් හෝ පොලිස් නිලධරයාගෙන් යම් හරස් ප්‍රශ්න අසනු ලැබීමට මහෙස්ත්‍රාත්වරයා අවසර නොදිය යුතු ය. නමුත් අවස්ථාවෝචිත පරිදි, එම විශේෂඥ සාක්ෂිකරුගේ වාර්තාවෙන් හෝ පොලිස් නිලධරයාගේ දිවුරුම් ප්‍රකාශයෙන් හෝ අවස්ථාවෝචිත පරිදි එම විශේෂඥ සාක්ෂිකරුගේ හෝ පොලිස් නිලධරයාගේ සාක්ෂි විභාගයෙන් පැන නගින යම් කරුණක් පිළිබඳව චූදිතයාට හෝ ඔහුගේ උත්තරවාදියාට අවශ්‍ය නම් යම් පැහැදිලි කිරීමක් සම්බන්ධයෙන් එම විශේෂඥ සාක්ෂිකරුගෙන් හෝ පොලිස් නිලධරයාගෙන් මහෙස්ත්‍රාත්වරයා විසින් විමසනු ලැබිය හැකි ය. තව ද, එම කරුණු සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත්වරයාට අවශ්‍ය වන යම් පැහැදිලි කිරීමක් මහෙස්ත්‍රාත්වරයා විසින් ම සාක්ෂිකරුගෙන් විමසනු ලැබිය හැකි ය. එසේ කරනු ලබන සෑම පැහැදිලි කිරීමක් ම වාර්තාගත කළ යුතු ය.

(10) විශේෂඥ සාක්ෂිකරුවකු හෝ පොලිස් නිලධරයකු විසින් කරනු ලබන ප්‍රකාශයන් හෝ මේ වගන්තිය යටතේ හරස් ප්‍රශ්න ඇසීම සඳහා ඉදිරිපත් කරන ලද සාක්ෂිකරුවකු විසින් දෙන ලද දිවුරුම් සාක්ෂියක් (14 වන අධිකාරය වූ ) සාක්ෂි ආඥාපනතේ 33 වන වගන්තිය ප්‍රකාරව සාක්ෂියක් ලෙස ආවේශ්‍ය කරනු ලබන බවට සලකනු ලැබිය යුතු ය.

(11) (අ) යම් චූදිතයකු-

(i) පැනගොස් සැඟවී සිටින විට හෝ දිවයින හැරගොස් ඇති විට; හෝ

(ii) රෝගාතුර වීම නිසා අධිකරණයට පැමිණීමට හෝ අධිකරණය තුළ රැඳී සිටීමට නොහැකිවන අවස්ථාවක සහ තමා අධිකරණයට නොපැමිණ සිටින විට නඩු විභාගය ආරම්භ කිරීමට හෝ දිගටම පවත්වාගෙන යාමට කැමැත්ත පළ කර ඇති අවස්ථාවක ඔහුට යම් අගතියක් නොමැතිව, එම නඩු විභාගය ආරම්භ කිරීම හෝ දිගටම පවත්වාගෙන යාම සිදු කළ හැකි ය; හෝ

(iii) අධිකරණය තුළ එම චූදිතයාගේ හැසිරීම හේතුකොටගෙන නඩු විභාගය පවත්වාගෙන යාමට බාධා කරන හෝ අවහිර කරන අවස්ථාවක,

මහෙස්ත්‍රාත්වරයා, මෙම කරුණු පිළිබඳව සෑහීමට පත් වන්නේ නම්, චූදිතයා පැමිණ නොමැති වුව ද, නඩු විභාගය ආරම්භ කොට පවත්වාගෙන යාම හෝ දිගටම පවත්වාගෙන යාම කළ හැකි ය.

(ආ) අධිකරණයට පැමිණ නැති එවැනි චූදිතයකු වෙනුවෙන් නීතිඥවරයකුට පෙනී සිටිය හැකි ය.

(ඇ) චූදිතයකු මහාධිකරණයට පැමිණ ඇති වුව ද, පැමිණ නැති වුව ද, මහාධිකරණයෙහි අධිචෝදනා මත නඩු විභාගයක් පවත්වනු ලබන අවස්ථාවක, වාර්තාගත කරන ලද දිවුරුම් සාක්ෂිවලට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 416 වන වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු වීම හැර ප්‍රායෝගිකව සිදු කළ හැකි තාක් දුරට මේ පනතේ විධිවිධානවලට අනුකූලව නඩු විභාගය පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

(12) විමර්ශනය අතරතුර දී සාක්ෂිකරුවකු විසින් පොලිසියට කරන ලද ප්‍රකාශය සමග, අවස්ථාවෝචිත පරිදි, (3) වන උපවගන්තිය යටතේ වාර්තාගත කරන ලද ඔහුගේ ප්‍රකාශ සහ පැහැදිලි කිරීම් ඇත්නම් ඒවා ද, (4) වන උපවගන්තිය යටතේ සිදුකර වාර්තාගත කරන ලද එකතු කිරීම්, වෙනස් කිරීම් සහ පැහැදිලි කිරීම් හෝ (5) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද හා වාර්තාගත කරන ලද විස්තරය, මේ පනතේ කාර්ය සඳහා එම සාක්ෂිකරුගේ දිවුරුම් සාක්ෂි ලෙස සලකනු ලැබිය යුතු ය.

(13) නඩු විභාගයේ දී චූදිතයාට එරෙහිව ඉදිරිපත් කරනු ලබන සෑම සාක්ෂිකරුවකුට ම, නීතිඥයකු මගින් පෙනී සිටීමට හිමිකමක් ඇත.

(14) ඉහත විස්තර කොට ඇති කාර්ය පටිපාටිය අවසන් වීමෙන් පසු නඩුව සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 153 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කළ යුතු බවට මහෙස්ත්‍රාත්වරයා විසින් සලකනු නොලබන්නේ නම්, මහෙස්ත්‍රාත්වරයා විසින් චූදිතයාට ඇති චෝදනා කියවිය යුතු අතර, සාමාන්‍ය භාෂාවෙන් එහි ස්වභාවය පැහැදිලි කළ යුතු ය. තව ද, චූදිතයාට සාක්ෂිකරුවන් කැඳවීමට අයිතියක් ඇති බවත් චූදිතයා කැමති නම් ඔහු වෙනුවෙන් ඔහුට ද සාක්ෂි දිය හැකි බවත් මහෙස්ත්‍රාත්වරයා විසින් චූදිතයාට පැහැදිලි කළ යුතු ය.

(15) මේ පනතේ විධිවිධාන යටතේ පවත්වනු ලබන යම් මූලික පරීක්ෂණයකට, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XV පරිච්ඡේදයේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

පනතේ කාලසීමාව.

7. (1) මෙම පනතේ විධිවිධාන මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භවන දින සිට අවුරුදු දෙකක කාලයක් සඳහා ක්‍රියාත්මකව පවතින්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වන කාලසීමාව අවසන් වීමට මාස එකකට පෙරාතුව වූ යම් වේලාවක් ඇතුළත, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් පනත ක්‍රියාත්මක වීම තවදුරටත් වූ කාලයක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි නමුත්, එවැනි යම් දීර්ඝ කිරීමක සම්පූර්ණ කාලසීමාව එසේ ප්‍රදානය කරන ලද දීර්ඝ කිරීමේ දින සිට අවුරුදු දෙකක් නොඉක්මවිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියමයක් ම අමාත්‍යවරයා විසින් එයට අත්සන් තැබීමෙන් පසු සහ එම සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසුව ක්‍රියාත්මක වන්නේ ය.

(4) (2) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම, එම නියෝගය ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට මාස තුනක කාලයක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) පාර්ලිමේන්තුව විසින් එම නියෝගය අනුමත කිරීමේ දිනය නිශ්චිතව දක්වමින් නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

වලංගු භාවය.

8. 2009 මැයි මස 31 වන දිනයෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන දිනයෙන් අවසන් වන කාලසීමාව ඇතුළත යම් තැනැත්තකු විසින්, 2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත මගින් හෝ එම පනත යටතේ තමා වෙත පවරන ලද යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කරනු ලැබූ හෝ ඉටු කරනු ලැබූ අවස්ථාවක, ඉහත සඳහන් 2007 අංක 42 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ ප්‍රතිපාදන ඉහත කී කාලසීමාව තුළ ක්‍රියාත්මක

නොවීම නොතකා, අවස්ථාවෝචිත පරිදි, එසේ ක්‍රියාත්මක කරනු ලැබූ, කරනු ලැබූ හෝ ඉටු කරනු ලැබූ බලතල, කාර්ය හෝ කර්තව්‍ය, ඉහත කී කාලසීමාව තුළ ඉහත කී පනත ක්‍රියාත්මකව පැවති ලෙස සලකා, අවස්ථාවෝචිත පරිදි, වලංගු ලෙස ක්‍රියාත්මක කර, කර හෝ ඉටු කර ඇති බවට සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය

(2 වන වගන්තිය)

| | I තීරුව | II තීරුව |
|---|---|---|
| 1. | අනුබල දෙනු ලැබූ වරද සිදු කරනු ලැබුවේ නම්, උපලේඛනයේ දක්වා ඇති වරදකට අනුබල දීම. | 102 වන වගන්තිය දණ්ඩ නීති සංග්‍රහය |
| 2. | උපලේඛනයේ දක්වා ඇති වරදකට අනුබලදීම හෝ වරද සිදු කිරීම සඳහා කුමන්ත්‍රණය කිරීම. | 113ආ වන වගන්තිය දණ්ඩ නීති සංග්‍රහය |
| 3. | මිනී මැරුම. | 296 වන වගන්තිය දණ්ඩ නීති සංග්‍රහය |
| 4. | මිනී මැරුමක් නොවන සාවාද්‍ය මනුෂ්‍ය ඝාතනය. | 297 වන වගන්තිය දණ්ඩ නීති සංග්‍රහය |
| 5. | මිනීමැරුමට තැත් කිරීම. | 300 වන වගන්තිය දණ්ඩ නීති සංග්‍රහය |
| 6. | මිනීමැරීම සඳහා අපහරණය කිරීම හෝ පැහැරගෙන යාම. | 355 වන වගන්තිය දණ්ඩ නීති සංග්‍රහය |
| 7. | අයුතු ලෙස සිරකර තැබීමේ චේතනාවෙන් යම් තැනැත්තකු අපහරණය කිරීම හෝ පැහැරගෙන යාම. | 356 වන වගන්තිය දණ්ඩ නීති සංග්‍රහය |
| 8. | බරපතල තුවාල කිරීම ආදිය සඳහා යම් තැනැත්තකු අපහරණය කිරීම හෝ පැහැරගෙන යාම. | 358 වන වගන්තිය දණ්ඩ නීති සංග්‍රහය |

| | | |
|---|---|---|
| 9. | අපහරණය කරන ලද තැනැත්තන් සඟවා තැබීම හෝ සිරකර තැබීම. | 359 වන වගන්තිය දණ්ඩ නීති සංග්‍රහය |
| 10. | ස්ත්‍රී දූෂණය. | 364 වන වගන්තිය දණ්ඩ නීති සංග්‍රහය |
| 11. | සොරකම, මරණය සිදු කිරීමට සූදානම් වීම ආදිය. | 371 වන වගන්තිය දණ්ඩ නීති සංග්‍රහය |
| 12. | මරණය හෝ බරපතල තුවාල සිදු කිරීමට තැත්කර කොල්ලකෑම. | 383 වන වගන්තිය දණ්ඩ නීති සංග්‍රහය |
| 13. | මාරක ආයුධවලින් සන්නද්ධ කොල්ල කෑමට තැත්කිරීම. | 384 වන වගන්තිය දණ්ඩ නීති සංග්‍රහය |
| 14. | ඉහත සඳහන් වැරදිවලින් යම් වරදක් සිදු කිරීමට තැත් කිරීම. | 490 වන වගන්තිය දණ්ඩ නීති සංග්‍රහය |
| 15. | පුපුරණ ද්‍රව්‍ය භාවිතා කිරීමෙන්, පීඩාකාරී ආයුධ භාවිතා කිරීමෙන් හෝ තුවක්කුවක් භාවිතා කිරීමෙන් සිදු කරන ලද යම් වරදක්. | (183 වන අධිකාරය වූ) පුපුරණ ද්‍රව්‍ය පනතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි පුපුරණ ද්‍රව්‍ය 1966 අංක 18 දරන පීඩාකාරී ආයුධ පනතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි පීඩාකාරී ආයුධ සහ (182 වන අධිකාරය වූ) තුවක්කු ආඥාපනතේ අර්ථ නිරූපණය කර ඇති පරිදි තුවක්කුව. |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 875 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළෙඹන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකි ය.